# බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන (PL – 1) පුරාවිද්‍යා සහායක III/ මුරකරු III තනතුරුවල පුරප්පාඩු පිරවීම

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පවතින පුරාවිද්‍යා ස්ථාන වල දැනට පුරප්පාඩුව පවතින ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) පුරාවිද්‍යා සහායක III / මුරකරු III තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | විවෘත පදනම මත පවතින පුරප්පාඩු |
|---|---|
| (i). පුරාවිද්‍යා සහායක III | 191 |
| (ii). මුරකරු III | 324 |

02. වැටුප් පරිමාණය - 2025.03.25 දින සිට අනුමත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව PL-01-2025 ට අනුකූලව රු.40,000 –10 x 450 –10 x 490 – 10 x 540 –12 x 590 – 61,880/- වැටුප් පරිමාණය වේ.

03. අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

වෘත්තීය සුදුසුකම් - අදාළ ක්ෂේත්‍රය තුළ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

පළපුරුද්ද - අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

වයස - අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ඉහත සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතු ය.

වෙනත්

i. පසුගිය වසර 05 ඇතුලත පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සුදුසුකම් අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

සටහන්

(අ). අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන්

* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41,44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද, විෂය අංක 42,45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

* අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත් වී ඇත්නම් (එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණ සමත් වුවද) සම්පූර්ණ විෂයම අසමත් ලෙස සළකනු ලැබේ.

* වෛකල්පිත සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත් වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය

(අ). ඉහත තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ලබාදෙනු ලබන අතර, සුදුසුකම් සපුරාලන අයදුකම්කරුවන් අදාළ පරීක්ෂණයට කැඳවනු ලබයි. සුදුසුකම් ලැබීම සඳහා අදාළ පරීක්ෂණයෙන් 40% කට වඩා ලකුණු ලබාගත යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත පදනම්ව, පවත්නා පුරප්පාඩු ප්‍රමාණය මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව ඉහළට ලකුණු ලබාගත් අය බඳවා ගනු ලැබේ.

(ආ). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍රයෙ සඳහා ලකුණු ලබාදෙනු ඇත.

| | | |
|---|---|---|
| i. | අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 20 |
| ii. | ක්‍රීඩා කෞශල්‍යය | ලකුණු 10 |
| iii. | තනතුරට අදාළ ක්ෂේත්‍ර පළපුරුද්ද | ලකුණු 45 |
| iv. | පුරාවිද්‍යා සංගම් ඇතුලු ස්වේච්ඡා සංගම්වල සාමාජිකත්වය | ලකුණු 05 |
| v. | වෙනත් වෘත්තීය සහතික | ලකුණු 15 |
| vi. | පෞරුෂත්වය | ලකුණු 05 |

05. සේවයේ නිරත කරවීමේ පොදු කොන්දේසි .

(අ). මෙම තනතුරු ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතු වේ. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද 2011.09.15 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ PL-01 තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අදාළ සියලු කොන්දේසිවලට ද එම බඳවාගැනීම් පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනයන්ට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු (PL-01) III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ.

(ආ). අයදුම්කරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතු ය.

(ඇ). විශිෂ්ඨ චරිතයකින් මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතු ය.

(ඈ). බඳවාගනු ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

06. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. (මුල් පිටපත් නොවේ.)

(අ). උප්පැන්න සහතික
(ආ). චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික 2ක් (ඥාතීන් නොවන අයගෙන් )
(ඇ). අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඈ). පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරි සහතික
(ඉ). ක්‍රීඩා පිළිබඳ ඉහළම ජයග්‍රහණ පිළිබඳ සහතික
(ඊ). වෙනත් වෘත්තීය සහතික
(උ). සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික
(ඌ). ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත්

07. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, අනෙකුත් අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය පූජ්‍ය ස්ථාන භාර පූජකවරයෙකු/ සාමදාන විනිශ්චයකරුවෙකු/ රජයේ විදුහල්පතිවරයෙකු හෝ රු.985,800/- නොඅඩු ආරම්භක වාර්ෂික වැටුප් පරිමාණයක සේවය කරනු ලබන රජයේ නිලධාරියෙකු විසින් සහතික කොට ඉදිරිපත් කළ යුතු ය.

08. මෙහි පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, තැ.පෙ. 532, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එය 2026.07.06 දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ අඩුපාඩු සහිත අයදුම්පත් මෙන්ම ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රයෙන් පරිබාහිරව යොමු කරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. යම් අපේක්ෂකයෙකුට මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේ දී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය සේවයෙන් පහ කිරිමට ඉඩ ඇත.

10. මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

ඊ.ඒ. සෙනරත් වික්‍රමසිංහ
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

2026 ජුනි මස ....03....... දින
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07

ඊ.ඒ. සෙනරත් වික්‍රමසිංහ
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)